පහත සඳහන් නියමයන් සහ කොන්දේසි, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. - PQ118 ("මින් මතුවට බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබේ") හි විවෘත කර පවත්වාගෙන යනු ලබන සියලුම නේෂන්ස් ළමා ආයෝජන සැලැසුම් ගිණුම් පාලනය කරනු ඇත.

ගිණුම විවෘත කිරීම

1. නේෂන්ස් ළමා ආයෝජන සැලසුම් ගිණුමක් ("NKIP ගිණුම"), විවෘත කරන අවස්ථාවේ වයස අවුරුදු 18ට වැඩි, බාල වයස්කරුවෙකුගේ දෙමාපියකු හෝ නීත්‍යානුකූල භාරකරුවකු (පහත විස්තර කර ඇති පරිදි) (මින් පසුව "පාරිභෝගිකයා" වශයෙන් හැඳුන්වනු ලබන) වන ඕනෑම පුද්ගලයකු විසින් විවෘත කළ හැකිය. ගිණුම කල් පිරෙන දිනයට පෙර ගනුදෙනුකරු මිය ගියහොත් NKIP ගිණුමේ ඇති ශේෂය ගෙවනු ලැබිය යුතු බාලවයස්කරුවකු (පවත්නා නීති වලට අනුව තීරණය කර ඇති පරිදි) (මින් මතුවට "බාලවයස්කරු" වශයෙන් හැඳින්වේ) ගනුදෙනුකරු විසින් ගිණුම් විවෘත කිරීමේ පෝරමයෙහි ප්‍රතිලාභියා (මින් මතුවට "බාලවයස්කරු" වශයෙන් හැඳින්වේ) වශයෙන් නම් කළ යුතුය. බාලවයස්කරුගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත සහ බාල වයස්කරුගේ නීත්‍යානුකූල භාරකාරත්වය තහවුරු කිරීම සඳහා බැංකුවට අවශ්‍ය නෛතික ලේඛන (අදාළ වන අවස්ථාවේදී) බැංකුවේ පරීක්ෂාව සඳහා NKIP ගිණුම විවෘත කරන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය.

2. සෑම NKIP ගිණුමකටම අංකයක් ලබා දෙනු ලබන අතර එය බැංකුව සමඟ කරනු ලබන සියලුම ලිපි හුවමාරු වලදී සහ සියලුම තැන්පතු පත්‍රවල (Deposit Slips) සඳහන් කළ යුතුය. පාරිභෝගිකයාට නිසි පරිදි දැනුම් දීමක් කර ලබා දෙන ලද අංකය වෙනස් කිරීමට බැංකුවට අයිතියක් ඇත.

කල්පිරීමේ ඉලක්ක මුදල සහ කල්පිරීමේ දිනය

3. NKIP ගිණුමක් රුපියල් 100,000/- ක අවම කල්පිරීමේ ඉලක්ක අගයක් වන රුපියල් 10,000,000/- ක උපරිම කල්පිරීමේ ඉලක්ක අගයකින් විවෘත කළ හැකිය.

   "කල්පිරෙන දිනය" යන්නෙහි තේරුම, පහත සඳහන් නියමයන් සහ කොන්දේසි වලට යටත්ව, කල්පිරීමේ ඉලක්ක මුදල පාරිභෝගිකයාට ලැබෙන දිනය යන්නයි.

   "කල්පිරීමේ ඉලක්ක අගය" යන්නෙහි තේරුම මෙම නියමයන් සහ කොන්දේසි වලට යටත්ව NKIP ගිණුම කල්පිරෙන දිනයේදී ලැබීමට පාරිභෝගිකයා බැංකුව සමඟ ගිවිසගෙන ඇති මුදල යන්නයි.

4. පරිණත ඉලක්ක අගය, කල්පිරෙන දිනය වනවිට බාලවයස්කරුගේ වයස අවුරුදු 18 නොඉක්මවා තිබීමට යටත්ව, අවම වශයෙන් වසර දෙකක (2) සහ උපරිම වශයෙන් වසර දහ අටක (18) කාල සීමාවකදී පාරිභෝගිකයාට ලැබෙන පරිදි තෝරා ගත හැකිය.

5. ඉහත අංක 4 වැනි වගන්තියට යටත්ව, ගනුදෙනුකරු ගිණුම විවෘත කිරීමේ පෝරමයේ ලබා ගැනීමට බලාපොරොත්තු වන කල්පිරීමේ ඉලක්ක අගය තෝරා එහි සඳහන් කළ යුතුය. ඒ අනුව, මෙම නියමයන් සහ කොන්දේසි වලට යටත්ව, පාරිභෝගිකයා විසින් තෝරා ගෙන ඇති කල්පිරීමේ දිනයේ දී කල්පිරීමේ ඉලක්ක අගය ලබා ගැනීමට සුදුසුකම් ලැබීම සඳහා, NKIP ගිණුමට තැන්පත් කළ යුතු මාසික වාරිකය සහ එම මාසික වාරිකය ගෙවිය යුතු දිනය බැංකුව විසින් ගණනය කර පාරිභෝගිකයාට දැනුම් දෙනු ලැබේ.

වාරික

6.

   අ) ආරම්භක තැන්පතුව, ඉලක්කගත කල්පිරීමේ අගය, ආයෝජන කාලසීමාව සහ ගිවිසුම්ගත පොලී අනුපාතය සැලකිල්ලට ගනිමින් බැංකුව විසින් මාසික වාරික මුදල ගණනය කරනු ලැබේ.

   ආ) නියමිත දිනට හෝ ඊට පෙර නිශ්චිත මාසික වාරික මුදල NKIP ගිණුමට තැන්පත් කිරීමට පාරිභෝගිකයා එකඟ වේ. ගනුදෙනුකරු විසින් තෝරා ගෙන ඇති කල්පිරීමේ ඉලක්ක අගය ලබා ගැනීමට සුදුසුකම් ලැබීම සඳහා මාසික වාරිකය කල් පිරෙන දිනය දක්වා මාසිකව නියමිත දිනට හෝ ඊට පෙර සම්පූර්ණයෙන් ගෙවීම අනිවාර්ය වේ. බැංකුව විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි සෑම මසකම නියමිත දිනට හෝ ඊට පෙර මාසික වාරිකය සම්පූර්ණයෙන් ගෙවීමට ගනුදෙනුකරු අපොහොසත් වුවහොත්, කල්පිරෙන දිනයේ දී කල්පිරීමේ ඉලක්ක අගය ගනුදෙනුකරු ට නොලැබෙනු ඇත.

7. 2020 ඔක්තෝබර් 15 දින සිට බලපැවැත්වෙන පරිදි, NKIP ගිණුමක් විවෘත කිරීමට සුදුසුකම් ලැබීමට,

ගනුදෙනුකරු විසින් NKIP ගිණුමට මාසික වාරික මුදල් තැන්පත් කිරීම සඳහා බැංකුවේ පවත්වාගෙන යනු ලබන ඉතුරුම්/ජංගම ගිණුමක් යටතේ ස්ථාවර උපදෙස් ලබා දිය යුතුය.

කෙසේ වෙතත්, බැංකුව විසින් NKIP ගිණුමට කරනු ලබන තැන්පතු වශයෙන් මුදල් සහ ගනුදෙනුකරුගේ නමින් ලියන ලද චෙක්පත් පිළිගත හැකිය. වෙනත් බැංකුවලින් නිකුත් කරන ලද චෙක්පත් සම්බන්ධයෙන්, වාරික මුදල NKIP ගිණුමට තැන්පත් කර ඇති බවට සලකනු ලබන්නේ අදාල චෙක්පත් නිශ්කාශනය වී නියමිත දිනය වනවිට NKIP ගිණුමට වාරික මුදල බැර කර ඇත්තේ නම් පමණි.

8. පහත 29 වගන්තියේ දක්වා ඇති පරිදි හැර, කල්පිරෙන දිනයට පෙර පාරිභෝගිකයා විසින් NKIP ගිණුමෙන් මුදල් ආපසු ගැනීමට අවසර දෙනු නොලැබේ.

<u>පොලිය සහ කල්පිරීමේදී ගෙවීම්</u>

9. NKIP ගිණුම විවෘත කරන අවස්ථාවේදී බැංකුව විසින් නියම කරන ලද අනුපාතයට අනුව පොලිය, NKIP ගිණුමේ දෛනික ශේෂය මත ගණනය කරනු ලබන අතර කල්පිරෙන දිනය දක්වා මාසිකව NKIP ගිණුමට එය බැර කරනු ලැබේ. නීතිය මගින් හෝ රෙගුලාසි මගින් නියම කරනු ලැබුවහොත් හෝ මෙම නියමයන් සහ කොන්දේසි අනුව පොලී අනුපාත වෙනස් කිරීමට හෝ සංශෝධනය කිරීමට බැංකුවට අයිතියක් ඇත.

10. ගණුදෙනුකරු මෙම නියමයන් සහ කොන්දේසි වලට අනුකූලව කටයුතු කර ඇත්නම්, නීතියෙන් නියම කරනු ලබන පරිදි කල්පිරීමේ දිනයේදී හෝ ආයෝජනය කරන කාලසීමාව තුළදී ගෙවිය යුතුවන අදාළ රජයේ බදු සහ වෙනත් ව්‍යවස්ථාපිත බදු අඩුකිරීම්වලට යටත්ව, කල්පිරෙන දිනයේදී බැංකුව විසින් කල්පිරීමේ ඉලක්ක මුදල ගෙවනු ඇත.

11. කල්පිරීමේ දිනට පෙර කල්පිරීමේ ඉලක්ක මුදල වෙත ළඟාවීමේ අරමුණෙන් පාරිභෝගිකයා NKIP ගිණුමට එකවර මුදල් තැන්පත් කරන්නේ නම්, කල්පිරීමේ ඉලක්කගත මුදල සම්පූර්ණ වූ දින සිට බැංකුව විසින් NKIP ගිණුමට අදාළව ගිවිසගෙන ඇති පොලී අනුපාතය අත්හිටුවා බැංකුවේ සම්මත ඉතුරුම් ගිණුම් අනුපානිකය හෝ බැංකුව විසින් තීරණය කරනු ලබන වෙනත් අනුපාතයක් මත කල්පිරෙන දිනය දක්වා පොලිය ගණනය කර ඒ බව ගනුදෙනුකරු ට දැනුම් දෙනු ලැබේ.

12. ගනුදෙනුකරු නියමිත මාසික වාරික ප්‍රමාණයට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් හෝ එම වාරිකයේ ගුණාකාර වශයෙන් අමතර මුදලක් ඕනෑම වේලාවක තැන්පත් කර කල්පිරෙන දිනට පෙර කල්පිරීමේ ඉලක්ක මුදලට ළඟා වන්නේ නම්, බැංකුව කල්පිරෙන අගයට ළඟාවූ දින සිට NKIP ගිණුමට අදාළව ගිවිසගෙන ඇති පොළී අනුපාතය අත්හිටුවනු අතර කල්පිරෙන දිනය දක්වා බැංකුවේ සම්මත ඉතුරුම් ගිණුම් අනුපාතයට හෝ බැංකුව විසින් තීරණය කරනු ලබන වෙනත් අනුපාතිකයට බැංකුව විසින් පොලිය ගණනය කරනු ලැබේ.

13. ගනුදෙනුකරු කල්පිරීමේ ඉලක්ක අගයට ළගාවී තිබුණත් නැතත්, ඒ පිළිබදව නොසලකා, NKIP ගිණුමේ පොලී අනුපාතිකය කල්පිරෙන දිනයේදී සම්මත ඉතුරුම් ගිණුම් අනුපාතයට හෝ බැංකුව විසින් තීරණය කරනු ලබන වෙනත් අනුපාතයකට මාරු කරනු කරනු ලැබේ.

14. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර ඇති පරිදි ගනුදෙනුකරු විසින් තමාගේ බදු ගෙවන තත්ත්වය සහ පදිංචිස්ථානය පිළිබඳ ව්‍යවස්ථාපිත ප්‍රකාශයක් ගිණුම විවෘත කිරීමේ ආකෘති පත්‍රයේ සම්පූර්ණ කළ යුතුය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් හෝ එවැනි කාර්යයන් සඳහා නීතියෙන් නම් කරන ලද වෙනත් අධිකාරියක් විසින් නිශ්චය කර ඇති රැඳවුම් බද්ද සහ අනෙකුත් ව්‍යවස්ථාපිත බදු බැංකුව විසින් අඩු කරනු ලැබේ. අදාළ අධිකාරිය විසින් පසුව හිමිකම් පෑමක් කරනු ලැබුවහොත්, නොගෙවා ඇති බදු ගනුදෙනුකරුගෙන් අය කර ගැනීමට බැංකුවට අයිතියත් ඇත.

<u>රක්ෂණය</u>

15. බාලවයස්කරු ගනුදෙනුකරුගේ ස්වභාවික දරුවෙක් නම් හෝ ගනුදෙනුකරු බාලවයස්කරුගේ නීතියෙන් පත් කර ඇති නීත්‍යානුකූල භාරකරුවෙක් නම්, බැංකුව විසින් NKIP ගිණුම විවෘත කර මාස 2ක් ඇතුළත ගනුදෙනුකරු සඳහා ජීවිත රක්ෂණ ආවරණයක් ලබා දෙනු ඇත. කෙසේ වෙතත් කල් පිරීමේ දිනයේදී රක්ෂණ ආවරණය ඉකුත් වන අතර ඉන් පසුව රක්ෂණ ප්‍රතිලාභ ගෙවනු නොලැබේ.

16. කල්පිරීමේ ඉලක්ක මුදල පිළිබදව නොසලකා රක්ෂණ ආවරණය උපරිම වශයෙන් රු. 2,000,000/- ට සීමා කරනු ලැබේ. එනම්, කල් පිරෙන දිනට පෙර පාරිභෝගිකයා මරණයට පත්වුවහොත් ලැබිය යුතු රක්ෂිත මුදල යනු, ගනුදෙනුකරු විසින් තෝරාගෙන ඇති කල්පිරීමේ ඉලක්ක මුදලට ලගාවීමට (එසේම ගනුදෙනුකරු මරණයට පත්වන විට එයට ලගාවී නොමැති නම්, එය සාක්ෂාත් කර ගත) හැකි වන

මුදලක් වනු ඇති නමුත් එය, රු. 2,000,000/- නොඉක්මවිය යුතුය. (උදා:- කල්පිරීමේ ඉලක්ක මුදල රුපියල් 2,000,000/- ට වැඩියෙන් තිබෙන ගනුදෙනුකරුවකුගේ අභාවයකදී සහ ගනුදෙනුකරු මිය යන විට NKIP ගිණුමේ මූලික තැන්පතුව සහ ඊට එකතු වී ඇති පොලිය රු. 2,500,000 ක් වේ නම්, රක්ෂණ ප්‍රතිලාභය ගෙවනු නොලැබේ).

උදා:- (අ) ගනුදෙනුකරු මිය යන විට NKIP ගිණුමේ ශේෂය (NKIP ගිණුමේ මූලික තැන්පතුව සහ එකතුවී ඇති පොළිය සමග) රුපියල් 350,000/- ක් වන අතර ඔහුගේ කල්පිරීමේ ඉලක්ක මුදල රු.1,000,000.00 ක් වේ නම්, රක්ෂණ ප්‍රතිලාභය වන්නේ රු.650,000.00 කි. (එනම් රු. 1,000,000.00 – රු.350,000.00)

උදා:- (ආ) ගනුදෙනුකරු මිය යන විට NKIP ගිණුමේ ශේෂය රුපියල් 350,000/- ක් වන අතර ඔහුගේ කල්පිරීමේ ඉලක්ක මුදල රු.3,000,000.00 ක් වේ නම්, රක්ෂණ ප්‍රතිලාභය වන්නේ රු. 1,650,000.00 කි. (එනම් රු. 2,000,000.00 – රු.350,000.00)

උදා:-(ඇ) ගනුදෙනුකරු මිය යන විට NKIP ගිණුමේ ශේෂය රුපියල් 350,000/- ක් වන අතර ඔහුගේ කල්පිරීමේ ඉලක්ක මුදල රුපියල් 2,500,000.00 ක් වේ නම්, රක්ෂණ ප්‍රතිලාභයක් ගෙවනු නොලැබේ.

17. රක්ෂණ ආවරණය යටතේ ප්‍රතිලාභය ලබා ගත හැක්කේ ගනුදෙනුකරුමරණයට පත්වන අවස්ථාව දක්වා පාරිභෝගිකයා මෙම නියමයන් සහ කොන්දේසි වලට සම්පූර්ණයෙන් අනුකූල වී ඇත්නම් පමණි.

18. ගනුදෙනුකරුවිසින් වාරික 2ක් ගෙවා නොමැති නම්, රක්ෂණ ආවරණය අවසන් වනු ඇත. එවැනි අවස්ථාවකදී, ගනුදෙනුකරුගේ NKIP ගිණුමෙන් අය කර ගැනීම ද ඇතුළුව, එවැනි පැහැර හැරීමක් සිදු වූ වර්ෂය තුළ බැංකුව විසින් පාරිභෝගිකයා වෙනුවෙන් ගෙවන ලද රක්ෂණ වාරිකය(යන්), ගනුදෙනුකරුගෙන් අයකර ගැනීමට බැංකුවට අයිතියක් ඇත.

19. මෙම නියමයන් සහ කොන්දේසි වලට අනුකූලව, මාසික වාරිකය නියමිත වේලාවට ගෙවීම සහතික කිරීම පාරිභෝගිකයාගේ වගකීම වේ. රක්ෂණය යටතේ ගෙවනු ලබන ප්‍රතිලාභය අහෝසිවන හෝ අහෝසිවීමක් වශයෙන් ගෙන දෙන්නාවූ ප්‍රතිඵලයන් පිළිබඳව ගනුදෙනුකරුට දැනුම් දීම බැංකුවෙහි වගකීමක් නොවන අතර බැංකුව ද ඒ සඳහා බැඳී නොමැත. කෙසේ වෙතත්, බැංකුවට එහි අභිමතය පරිදි එවැනි අවලංගු වීමක් සිදුවීමට පෙර හෝ පසුව දැනුම් දිය හැක.

20. රක්ෂණ ආවරණය අදාල රක්ෂණ සමාගමේ නියමයන් සහ කොන්දේසි වලට යටත් වන අතර ගනුදෙනුකරුඅවශ්‍ය වුවහොත් වෛද්‍ය පරීක්ෂණද ඇතුළුව රක්ෂණ සමාගමේ සියලුම නියමයන් සහ කොන්දේසිවලට අනුකූල විය යුතුය.' ගනුදෙනුකරු රක්ෂණය කිරීමට රක්ෂණ සමාගම අපොහොසත් වුවහොත් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් බැංකුව ගනුදෙනුකරුට ඒ සම්බන්ධයෙන් වගකීමට බැඳී නොමැත. බැංකුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර රක්ෂණ සමාගමේ නියමයන් සහ කොන්දේසි වල පිටපතක් ගනුදෙනුකරුට ලබා ගත හැකිය.

21. රක්ෂණ සමාගම විසින් ගනුදෙනුකරුයටත්විය යුතු යයි ඉල්ලා සිටිනු ලබන ඕනෑම වෛද්‍ය ඇගයීමක /පරීක්ෂණයක වියදම ගනුදෙනුකරුවිසින් දැරිය යුතුය.

22. බාලවයස්කරුට හෝ ඔහුගේ/ඇයගේ භාරකරුට, හෝ ගනුදෙනුකරුගේ උරුමක්කරුවන්ට පොල්ම:කරුවන්ට සහ/හෝ අද්මිනිස්ත්‍රාසිකරුවන්ට, රක්ෂණ සමාගමේ අවසාන සහ තීරණාත්මක වන ඕනෑම තීරණයකට එරෙහිව බැංකුවෙන් හිමිකම් පෑමට අයිතියක් නොමැත.

<u>කල් පිරෙන දිනට පෙර</u> ගනුදෙනුකරුමියයාම

23. කල් පිරෙන දිනට පෙර ගනුදෙනුකරුමිය ගියහොත්, බැංකුව විසින් NKIP ගිණුම වසා දමනු ලබන අතර, බාලවයස්කරුගේ නමින් නේෂන්ස් ළමා ගිණුමක් විවෘත කර ගනුදෙනුකරු මියයන දිනය වනවිට එම ගිණුමේ තිබෙන ශේෂය සහ සියලුම උපචිත පොලිය සමඟින් රක්ෂණයෙන් ලැබිය යුතු මුදල්, ගනුදෙනුකරුවිසින් ගෙවිය යුතු ව්‍යවස්ථාපිත බදු සහ අයකිරීම් අඩුකර ගැනීමෙන් අනතුරුව නේෂන්ස් ළමා ගිණුම වෙත පැවරීමට ගනුදෙනුකරු එකඟ වන අතර බැංකුවට බලය පවරයි.

24. නේෂන්ස් ළමා ගිණුම, ගනුදෙනුකරුට දැනුම් දීමක් කර විටින් විට සංශෝධනයට ලක්විය හැකි, බැංකුවේ නේෂන්ස් ළමා ගිණුම් සඳහා වන නියමයන් සහ කොන්දේසි මගින් පාලනය වේ

25. බාලවයස්කරු ගනුදෙනුකරුට පෙර මියගියහොත් සහ ගනුදෙනුකරුද කල් පිරෙන දිනට පෙර මිය ගොස් තිබේ නම්, ගනුදෙනුකරුගේ අභාවය සිදු වූ දිනට NKIP ගිණුමේ පවතින ශේෂය, බලපැවෙන්වෙන නීතියට අනුකූලව, ගනුදෙනුකරුවිසින් ගෙවිය යුතු බදු සහ

ව්‍යවස්ථාපිත බදු අඩුකර ගැනීමෙන් අනතුරුව ගනුදෙනුකරුගේ උරුමක්කරුවන්ට, පොල්ම:කරුවන්ට හෝ අද්මිනිස්ත්‍රාසිකරුවන්ට ගෙවනු ලැබේ.

26. රක්ෂණ හිමිකම ගෙවීම සඳහා, ගනුදෙනුකරුගේ මරණය පිළිබඳව ගනුදෙනුකරුගේ උරුමක්කරුවන්, පොල්ම:කරුවන් හෝ අද්මිනිස්ත්‍රාසිකරුවන් විසින් මියගිය දින සිට මාස 2ක් ඇතුළත බැංකුවට දැනුම් දිය යුතුය. මෙම කාලසීමාව තුල දැනුම්දීමට අපොහොසත් වීම රක්ෂණ හිමිකම් ගෙවනු නොලැබීමට හේතු විය හැකිය.

<u>ගිණුම වසා දැමීම / අවසන් කිරීම</u>

27. **<u>ගෙවීම් පැහැර හැරීම:</u>** ගනුදෙනුකරු විසින් අඛණ්ඩව මාසික වාරික 2ක් නියමිත දිනට ගෙවීම පැහැර හැරියහොත් පහත සඳහන් පරිදි කටයුතු කිරීමට බැංකුවට අයිතියක් ඇත.

අ. NKIP ගිණුම වසා දමා එකතු වී ඇති පොලිය ද සමඟ ආයෝජනය කරන ලද මූලික මුදල ගනුදෙනුකරුට ගෙවීම.

හෝ

ආ. කල් පිරෙන දිනය දක්වා NKIP ගිණුම දිගටම පවත්වාගෙන යාම.

28. ඉහත 27 වැනි වගන්තියේ සඳහන් අවස්ථා දෙකේදීම, අවසන් වාරිකය ගෙවීම පැහැර හරින ලද දිනයේ සිට NKIP ගිණුම වසා දමන දිනය දක්වා හෝ කල් පිරෙන දිනය දක්වා (අදාළ වන පරිදි) වූ කාලසීමාව සඳහා වන පොලිය, බැංකුවේ සම්මත ඉතුරුම් ගිණුම් අනුපාතිකයට අනුව හෝ බැංකුව විසින් තීරණය කරනු ලබන වෙනත් අනුපාතිකයට අනුව ගණනය කරනු ලැබේ. ගනුදෙනුකරුවිසින් පසු අවස්ථාවකදී බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන එම NKIP ගිණුමට හිඟ වාරික සියල්ල තැන්පත් කළ ද පොලී ගණනය කිරීම ඉහත පරිදිම සිදු වේ.

29. **<u>පරිණතයට පෙර වසා දැමීම:</u>** සුවිශේෂී අවස්ථාවන් වලදී සහ බැංකුවේ පරම අභිමතය පරිදි හැර, කල් පිරෙන දිනට පෙර NKIP ගිණුම වසා දැමීමට සහ/හෝ එහි පවතින ශේෂය ආපසු ගැනීමට ගනුදෙනුකරුට අවසර ලබා දෙනු නොලැබේ. කල්පිරෙන දිනට පෙර NKIP ගිණුම වසා දැමීමට බැංකුව විසින් ගනුදෙනුකරුට අවසර දෙන අවස්ථාවකදී, ගිණුම විවෘත කළ දිනයේ සිට වසා දමන දිනය දක්වා, බැංකුව විසින් එහි සම්මත ඉතුරුම් ගිණුම් අනුපාතය හෝ බැංකුව විසින් තීරණය කරනු ලබන වෙනත් අනුපාතිකයක් යොදනු ඇති අතර ගනුදෙනුකරු විසින් ආයෝජනය කර ඇති මුදල සඳහා බැංකුව විසින් දැනටමත් ගෙවා ඇති අතිරික්ත පොලිය අය කර ගනු ඇත.

30. **<u>බැංකුව විසින් වසා දැමීම:</u>** අවසන් වරට බැංකු වාර්තාවල සඳහන් වන ගනුදෙනුකරුගේ තැපැල් ලිපිනයට හෝ බැංකුව වෙත ලබා දී ඇති ගනුදෙනුකරුගේ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට දින 14ක ලිඛිත දැනුම්දීමක් කර, ඕනෑම අවස්ථාවකදී NKIP ගිණුම වසා දැමීමේ අයිතිය බැංකුව රඳවා තබා ගනී.

31. ඉහත 27 හෝ 29 වැනි වගන්ති වල ලැයිස්තු ගත කර ඇති ඕනෑම තත්වයක් යටතේ වූවද, බැංකුව විසින් හෝ ගනුදෙනුකරු විසින් NKIP ගිණුම වසා දමනු ලැබුවහොත්, බැංකුවට තම අභිමතය පරිදි රක්ෂණ වියදම් සහ/හෝ NKIP ගිණුමට අදාළ වන ප්‍රතිලාභ සහ සේවා සැපයීමේදී බැංකුව විසින් දරා තිබිය හැකි වෙනත් නිශ්චිත වියදම් බැංකුව විසින් අයකර ගත හැකිය.

32. මෙම නියමයන් සහ කොන්දේසි යටතේ NKIP ගිණුම වසා දැමීමේදී, ගනුදෙනුකරුට මුදල් ගෙවීමට පෙර, අදාළ රජයේ බදු සහ ව්‍යවස්ථාපිත බදු සහ ගිණුම වසා දැමීමේ ගාස්තුව (අදාළ වන වුවහොත්) බැංකුව විසින් අඩු කරනු ඇත.

33. NKIP ගිණුම වසා දැමීමෙන් 42 වැනි වගන්තිය ප්‍රකාරව බැංකුව සතුව ඇති අයිතිවාසිකම් වලට කිසිදු අගතියක් සිදු නොවන අතර ඒ අනුව, 42 වැනි වගන්තියට අනුව එහි අයිතිවාසිකම් ක්‍රියාත්මක වන තුරු NKIP ගිණුමේ මුදල් මුදා හැරීමට බැංකුව කිසිසේත් බැඳී නොමැත.

පොදු කොන්දේසි

34. ගනුදෙනුකරුවිසින් තෝරා ගෙන ඇති NKIP ගිණුමේ විස්තර ඇතුළත් ආයෝජනය පිළිබඳ දැනුම්දීමක් NKIP ගිණුම විවෘත කරන අවස්ථාවේදී ගනුදෙනුකරු වෙත නිකුත් කරනු ලැබේ. ගනුදෙනුකරුවෙත පාස්පොතක් නිකුත් කරනු නොලැබේ.

35. ගනුදෙනුකරු විසින් තෝරා ගෙන ඇති පරිදි මුද්‍රිතව හෝ ඉලෙක්ට්‍රොනිකව ගිණුම් ප්‍රකාශයන් අර්ධ වාර්ෂිකව බැංකුව විසින් ගනුදෙනුකරුවෙත යවනු ඇත. කෙසේ වෙතත්, බැංකුව, තම අභිමතය පරිදි ගනුදෙනුකරු වෙත ලබා දෙන ප්‍රකාශවල වාර ගණන වෙනස් කිරීමේ අයිතිය රඳවා තබා ගනී.

36. වසර 6 ක කාලසීමාවක් සඳහා පමණක් (හෝ බැංකුව විසින් තීරණය කරනු ලබන වෙනත් කාල සීමාවක්) බැංකුව විසින් ප්‍රකාශවල පිටපත් තබා ගනු ඇත. එවැනි සියලුම වාර්තා වසර 6කට පසු විනාශ කරනු ලබන අතර වසර 6කට පසු ප්‍රකාශ පිටපත් ලබාදීම සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් භාර නොගනී.

37. ගිණුම් ප්‍රකාශයක් ගනුදෙනුකරුට නොලැබුනේ නම් හෝ එය බැංකුව විසින් ඉලෙක්ට්‍රොනික මාර්ග හරහා ලබා නොදුන්නේ නම්, ප්‍රකාශය ලැබීමට නියමිත දින (එනම් සෑම වසරකම ජූනි 20 සහ දෙසැම්බර් 31 යන දිනයන්) සිට දින 15ක් ඇතුළත බැංකුවට ඒ සම්බන්ධව දැනුම් දිය යුතුය.

තොරතුරු නිවැරදිව ඇතුල් කර ඇති බව සහතික කිරීම සඳහා බැංකුවෙන් ලැබෙන සෑම ගිණුම් ප්‍රකාශයක්ම පරීක්ෂා කිරීමට ගනුදෙනුකරුඑකඟ වේ. කිසියම් දෝෂයක් වෙතොත් ප්‍රකාශය ලැබුණු දින සිට දින 21ක් ඇතුළත ඒ බව බැංකුවට දැනුම් දිය යුතුය.

38. ගනුදෙනුකරුඔහුගේ/ඇයගේ ප්‍රකාශයේ පිටපත් සංරක්ෂණය කිරීමේ වගකීම භාරගත යුතුය. බැංකුවෙන් ප්‍රකාශවල පිටපත් ඉල්ලා සිටියහොත්, බැංකුවේ ප්‍රකාශිත ගාස්තු අයකිරීම් වලට අනුකූලව මෙම සේවාව සැපයීම සඳහා ගාස්තුවත් අය කිරීමේ අයිතිය බැංකුව සතුය.

39. බැංකුව සිය අභිමතය පරිදි යවන්නේ නම් මිස, NKIP ගිණුමට තැන්පත් කළ මුදල් හෝ චෙක්පත් බැංකුව වෙත ලැබී ඇති බව දන්වා වෙනම දැනුම්දීමක් තැපෑලෙන් යවනු නොලබයි.

40. ගනුදෙනුකරුගේ තැපැල් හෝ විද්‍යුත් තැපැල් ලිපිනයේ යම් වෙනසක් සිදු වුවහොත් ගනුදෙනුකරු ඒ සම්බන්ධයෙන් බැංකුවට ලිඛිතව දැනුම් දිය යුතුය.

41. මෙම නියමයන් සහ කොන්දේසි යටතේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට හැර NKIP ගිණුම යටතේ ගනුදෙනුකරුගේ අයිතිවාසිකම් හෝ වගකීම් කිසිවක් ගනුදෙනුකරුවිසින් පැවරීමක් හෝ මාරුකිරීමක් සිදු නොකළ යුතු අතර එවැනි ගනුදෙනුවකින් ඍජුව හෝ වක්‍රව සිදුවන පාඩුවකට බැංකුව බැඳී හෝ වගකිව යුතු නොවේ.

42. මෙහි අඩංගු කිසිවකට පටහැනි වුවද ඒ පිළිබඳව නොසලකා, ගනුදෙනුකරුගේ NKIP ගිණුම, බැංකුව සමඟ ගනුදෙනුකරුගේ ඇති ඕනෑම ගිණුමක් සමඟ හෝ ගනුදෙනුකරුගේ වෙනත් ඕනෑම වගකීමක් සමඟ ඒකාබද්ධ කර හෝ එකට එක යා කර, NKIP ගිණුමේ බැර වී ඇති ඕනෑම මුදලක් ගනුදෙනුකරුගෙන් බැංකුවට අයවිය යුතු වෙනත් ඕනෑම මුදලක් වෙනත් ඕනෑම ගිණුමකට හෝ වෙනත් ඕනෑම ආකාරයකින්, එවැනි වගකීම් සත්‍ය හෝ අවිනිශ්චිත, ප්‍රාථමික හෝ ඇපකර සහ කිහිපයක් හෝ ඒකාබද්ධ එකක් වූවද, පැවරීමට හෝ මාරු කිරීමට ගනුදෙනුකරු මෙයින් එකගත්වය පළ කර ඒ සඳහා බැංකුවට බලය පවරනු ලබයි.

43. ගනුදෙනුකරුට දැනුම්දීමක් කර මෙම නියමයන් සහ කොන්දේසි තම අභිමතය පරිදි ඕනෑම වේලාවක වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට හෝ එකතු කිරීමට බැංකුවට අයිතියක් ඇත.

44. වෙනත් ආකාරයකට එකඟ වී ඇත්නේනම් මිස, ගනුදෙනුකරුවන්ට ලිඛිතව, තැපැල් මගින් සහ/හෝ බැංකුවේ විද්‍යුත් සන්නිවේදන මාර්ග හරහා සහ/හෝ බැංකුව විසින් සුදුසු යැයි සලකනු ලබන වෙනත් සුදුසු ආකාරයකින් දැනුම්දීම් යවනු ලැබේ.

දැන්වීම් බෙදාහැරීමක්/යවාතිබීමක් අසාර්ථක වී ඇති බවට දැනුම්දීමක් බැංකුවට නොලැබුණේනම් මිස, යවන ලද දැනුම්දීමක් එය,

තැපෑලෙන් යවා ඇත්නම්, එසේ තැපැල් කිරීමෙන් දින 2 කට පසුව

සහ:

විද්‍යුත් තැපෑලෙන් හෝ වෙනත් විද්‍යුත් මාර්ගයක් හරහා යවා ඇත්නම්, එසේ යවා පැය 24කට පසුව දැනුම්දීම් ඵලදායී ලෙස සලකනු ලැබේ. යවා තිබීම අසාර්ථක වී ඇත්නම් බැංකුව වෙනත් ආකාරයකින් එය සන්නිවේදනය කරනු ඇත.

දිනපතා පුවත්පත්වල, බැංකු ශාඛාවල, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවල හෝ බැංකුවේ වෙබ් අඩවියේ පළ කරනු ලබන ප්‍රසිද්ධ නිවේදන ලෙස දැනුම් දීමක් සිදු කළ හැකිය. එවැනි අවස්ථාවන් වලදී, ඒවා ප්‍රකාශනය කරන අවස්ථාවේ දී හෝ පළ කරනු ලබන අවස්ථාවේදී හෝ බැංකුව විසින් සන්නිවේදනයේ සඳහන් කර ඇති වෙනත් අවස්ථාවකදී ක්‍රියාත්මක වේ.

ඉහත සඳහන් කර ඇති ආකාරයට යවන ලද දැනුම්දීමක් ප්‍රමාණවත් පරිදි සහ නිසි පරිදි කරන ලද දැනුම්දීමක් ලෙස සලකනු ලබන අතර එයට ගනුදෙනුකරු බැඳී සිටිය යුතුය.

ගනුදෙනුකරුවෙකු විසින් යාවත්කාලීන කරන ලද

තමන් හා සම්බන්ධ විය හැකි සම්බන්ධතා තොරතුරු බැංකුවට ලබා නොදෙන්නේ නම්, දැනුම්දීම් නොලැබීම හේතුවෙන් පැන නගින ඕනෑම අලාභයක් ගනුදෙනුකරු විසින්ම දැරිය යුතුය. බැංකුවට අවසන් වරට දැනුම් දී ඇති ලිපිනය හරහා / සම්බන්ධතා අංක ඔස්සේ ගනුදෙනුකරු හා තවදුරටත් සම්බන්ධ විය නොහැකි බවට බැංකුව සාධාරණ ලෙස විශ්වාස කරන්නේ නම්, බැංකුව විසින් දැන්වීම් යැවීම අත්හිටුවීමට හෝ නැවැත්වීමට හැකිය. එවැනි අවස්ථාවකදී, ගනුදෙනුකරුNKIP ගිණුමට අදාළ සියලු දැනුම්දීම් යැවීමේ අවශ්‍යතා අත්හැර ඇති බව සලකනු ලැබේ.

45. මෙම නියමයන් සහ කොන්දේසි වලට අමතරව, NKIP ගිණුම බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාරික කොන්දේසි වල අන්තර්ගත කර ඇති නියමයන් සහ කොන්දේසි වලට ද යටත් වේ.

46. මෙම නියමයන් සහ කොන්දේසි ශ්‍රී ලංකාවේ නීති මගින් පාලනය වනු ඇත.

මෙහි අඩංගු නියමයන් සහ කොන්දේසි මා විසින් කියවා තේරුම් ගෙන ඇති අතර එයට බැඳී සිටීමට මෙයින් එකඟ වෙමි.

.....

ගනුදෙනුකරුගේ අත්සන

දිනය: